10 වන පිටුවෙන් (දයාවංශ ජයකොඩි)

ප්‍රකාශකයෝ කියලා පොත් කීපයක් ගැහුවා. රංජිත් ධර්මකීර්තිගෙ "රතු කඳුලු" නිමල් සේදරගෙ "කටු අග පිපි මල" වගේ පොත්. මුලින්ම ගැහුවෙ නිමල් ආරියවංශ පෙරේරා ගෙ "සාහිත්‍ය සංග්‍රහය" කියන පොත. ඒ 1962 දි හෙළබිම ප්‍රකාශකයෝ නමින්.

මුලින්ම දයාවංශ ජයකොඩි සහ සමාගම නමින් ගැහුවෙ පී ඇම් ජයතිලකගෙ "ගිනිදැල්" පොත. මේ පොත නැගල ගියා. පොත් 2000ක් ගැහුවා. බිල රුපියල් 2000 යි. රුපියල් 4ට වික්කෙ. හත් අටදාහක් ලාබ ආවා. ඊළඟට කුමාර කරුණාරත්න මහත්තය ආවා. එයාගෙ පොත් එකපාර 13000 ගානෙ ගැහුවෙ. සිතට සිතක්. අතුරු මිතුරු.. ඔබයි මමයි වගේ පොත්. එතන ඉඳන් ක්‍රමයෙන් ව්‍යාපාරය වැඩි දියුණු වුණා. තාත්තගෙ ලී බඩු සාප්පුවෙ පැත්තක ඉඳන් කළ මේ පොත් ව්‍යාපාරය තමයි අද මේ තරම් විශාල එකක් බවට පත්වුණේ. අද අපේ ශාඛාවක් ඇමරිකාවෙත් තියෙනවා.

අපේ පොත් වල ඒ කාලෙ ඉඳලම නිසි ප්‍රමිතියක් අපි ආරක්ෂා කර ගත්තා. පොතේ ප්‍රමාණය විතරක් නෙවෙයි මුද්‍රණයේ උසස් බවත් අපි රැකගත්තා. අපේ පොත් වල සෝදු පත් අපි හරියටම බලන නිසා අකුරු අඩුපාඩුත් නැහැ. ව්‍යාකරණ වැරදි නැහැ. මේ හැම පොතක්ම මාත් කියවලා තමයි මුද්‍රණයට තෝරාගන්නෙ. ඒ නිසා පාඨකයන්ට අපේ පොත් ගැන විශ්වාසයක් තියෙනවා.

**ඔබේ හෙළබිම පුවත්පත බලන විට පේන දෙයක් තමයි අද ප්‍රවීණ ලේඛකයන් බවට පත්ව සිටින බොහෝ දෙනෙක් ඒ කාලයේ පාසල් ශිෂ්‍යයන් ලෙස ලිපි ලියා ඇති බව.**

ඔව්. බොහෝ පිරිසක් හෙළබිමෙන් හඳුන්වා දුන්නා. කේ ජයතිලක මහත්මයගෙ ආරම්භක කාලෙ ඒ. ප්‍රේමකීර්ති ද අල්විස් මහත්මය පළමු ලිපිය ලිව්වෙත් මේ පුවත්පතට. ධර්මසිරි ගමගේ නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා මහාචාර්ය ජිනදාස දනන්සූරිය මහාචාර්ය සුනිල් ආරියරත්න මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර වැනි විශාල පිරිසක් එදා ශිෂ්‍යයන් ලෙස හෙළබිමට එක්වුණා.

**ඔබ පොත් ප්‍රකාශකයෙක් බවට පත් කරන්නෙත් මේ පුවත්පත් පිස්සුව ම නේද?**

ඔව්. මම පොත් ප්‍රකාශණ ක්ෂෙත්‍රයට එක්වෙන්නෙම සාහිත්‍යය කෙරෙහි මගේ තිබුණ ඇල්ම නිසාමයි. මේ වැඩෙන් ලාබ ගන්න පුලුවන්ද කියන දෙයක් මගේ හිතේ තිබුණෙම නැහැ. පොත් පත් කෙරෙහි තිබුණ ආසාව නිසාම වැඩේ පටන් ගත්තා.

**ඔබ ලේඛකයෙක්. ඇයි දැන් ලේඛණ කාර්යයට වැඩිය යොමු නොවෙන්නෙ?**

විශේෂයෙන්ම කාල වේලාව පිලිබඳ ප්‍රශ්නය තමයි ඒකට බලපාන්නෙ. මගේ සිංහලයේ ජාතික සටන් කියන පොතෙන් පසුව මම විවිධ පුවත්පත් වලට වරින් වර ලිපි ලියනවා. ජාතික වශයෙන් වැදගත් ප්‍රශ්නයකදි මම නිහඬව ඉන්නෙ නැහැ. "සිංහලයේ ජාතික සටන්" කියන මගේ පොත ලියන්න මම විශාල පර්යේෂණයක් කළා. කලින් ප්‍රකාශයට පත් නොවුණ කරුණු කාරණා සොයන්න විශාල මහන්සියක් ගත්තා. අවුරුදු අටක් ගියා ඒ වැඩේට.

මට දැන් ආසාවක් තියෙනවා ලන්දේසි යුගය ගැන පොතක් ලියන්න. කවුද මේ මායාදුන්නේ. ඒ යුගයේ තිබුණ රාජධානි පිළිබඳ නිවැරදි කරුණු මොනවද වැනි දේ හරියට සොයාගෙන ලියන්න මම හිතාගෙන ඉන්නවා. මේ සම්බන්ධයෙන් මැන්දිස් රෝහණධීර මහත්මයා සමගත් මම කතා කරලා තියෙනවා.

**හෙළබිම පුවත්පත නැවත දිගටම පවත්වාගෙන යන්න ඔබ අපේක්ෂා කරනවද?**

මෙහෙමයි. පුවත්පතක් හැටියට නෙවෙයි. සඟරාවක් ලෙස. සාහිත්‍ය ලෝකය ගැන කතා කරන සඟරාවක් ලෙස මෙය කරගෙන යන්න අදහසක් තියෙනවා. අපේ ලේඛකයන් මේ දවස් වල මොනාද කරන්නෙ. අපේ ආයතනයේ මොනාද කෙරෙන්නෙ. අනෙක් පොත් ප්‍රකාශකයන් අතින් ප්‍රකාශනයට පත් වෙන පොත් පිලිබඳ විස්තර මොනවාද. මෙන්න මේ වගේ සාහිත්‍ය ලෝකයට යොමුවුණ සඟරාවක් ලෙස හෙළබිම පවත්වාගෙන යන්න මම හිතනවා.

**ඔබ විශාල සංඛ්‍යාවක් ලේඛකයන් හඳුන්වා දී තිබෙනවා**

ප්‍රකාශකයෙකුට ලේඛකයන් හදන්න බැහැ. ප්‍රකාශකයෙක් හැටියට මම කරන්නෙ ලේඛකයන් හඳුනාගෙන ඔවුන් ඔප මට්ටම් කරලා ගැනීම. සාහිත්‍යය කෙරෙහි මගේ තිබෙන ඇල්ම නිසාම මට ඒ කාර්යය හරියට කරන්න පුලුවන් කියලා මට හිතෙනවා.

**එදත් අදත් පොත් ප්‍රකාශනය ගැන ඔබේ අදහස මොකක්ද**

අද වන විට තාක්ෂණය ඉතා දියුණුවෙලා තියෙනවා. ඉස්සර අපි අකුරු අමුනලා මුද්‍රණාල වලට දීලා තමයි පොත් මුද්‍රණය කළේ. ඒ හැටියට පොතක් මුද්‍රණය කරන්න මාස හයක් විතර ගියා. ඉන් පස්සෙ තමයි අපටම කියලා මුද්‍රණාල ගත්තෙ. අද අපට ලංකාවේ තිබෙන නවීනතම මුද්‍රණාලයක් තිබෙනවා. අද පොතක් මුද්‍රණය කිරීම ඉතා ඉක්මන්. අද අපට එක සුමානයකින් පොතක් මුද්‍රණය කරන්න පුලුවන්.

මේ කොයි දේ කළත් මම හැම තිස්සෙම අපේ ප්‍රමිතිය ආරක්ෂා කරගන්නවා. මුද්‍රණයේ නිමාව විතරක් නෙවෙයි. අන්තර්ගතය ගැනත් මම සැළකිලිමත් වෙනවා. ඒ නිසා තමයි අපි වාර්ෂිකව තරගයක් තියලා හොඳ නවකතා තෝරාගන්නෙ. බලන්න ගිය සැරේ මුල් තැනට ආව "මාගම් සෝලි" කියන පොත . ඒක ඉතා හොඳ නිර්මාණයක්. මේ ලේඛකයා කොහෙද හැංගිලා හිටියෙ. අපි ඔහු මතු කරලා ගත්තා. දක්ෂයන් හරියට ඉන්නවා. ඔවුන් ඉදිරියට ගන්නට මේ තරගය අපි දිගටම පවත්වාගෙන යනවා. ගිය සැරේ අපි පනස්දාහක් තෑගි දුන්නා. මේ සැරේ ඒක ලක්ෂය දක්වා වැඩි කරනවා.

**ඔබට පේන විදිහට අපේ රටේ අනාගතය කොහොම වෙයිද**

අපේ රටේ ස්වර්ණමය යුගය ආරම්භ වුණා කියලයි මට හිතෙන්නෙ. අපි සුබවාදී වෙන්න ඕනෙ. මට පේන විදිහට අපේ රටේ අනාගතය ඉතාම සුබදායක එකක් වෙනවා. ජය ශ්‍රී මහ බෝ සමිඳුන්ගෙ පිහිටෙන් අපේ රට දියුනුවටම යන බව මට විශ්වාසයි.




(1)

නිමක් නොමැතිව ගලා යමි
ඔබ නිසා මම
ඒ ඔබේ සිතැඟියි ඒ ඔබේ සතුටයි
සියෂතත් නැවත නැවතත්
පිරෙයි ඉතිරෙයි නැවතත්
මේ දුබල මැටි බඳුන
සුවඳ පැතිරෙයි
නැවුම් ජීවනයේ

හැඩවේය අකාලික
නැවුම් ගී තනු රටා
ඔබේ සුසුමින් අවදිවී
මේ පරඬලා වස් දඬු හිසින්
කඳු සිකර ඔිවිටි මැදින්

ඔබේ අතැඟිලි තුඩින් පිරිමැද
අමර පහසින් සලිතවෙයි ඉපිලයයි
මහද හඬ නැගෙයි මිමිණෙයි
වදන්වැල් දිව්‍යමය

ඔබේ නිම් නැති තිලිණ
පිරී ඉතිරෙයි මේ දිළිඳු දෝතේ මගේ
කල්පයෙන් කල්පය පිරෙයි
තවමත් එහෙත් හිඩැස් ඇත පිරෙන්නට
ලැබෙතත් කොතෙක් අපමණ

(2)

සත් කරන සඳ ගයන්නට මට ඔබ
හද පිරෙයි උදම් වී
නගමි කඳුලින් පිරෙන මා නෙත්
දකින්නට ඔබේ වත

බිඳුණු කඩතොළු
කැඩුණු රළු කොන් ජීවිතේ
දියව සැඟවෙයි මිහිරි තනුවක
මගේ තුති ගී පියාපත් විහිදා සරයි
ගුරුළු සේ තරණා
නිමක් නැති සයුරු හිස

මගේ ගීතය ඔබේ සවණත
පිනවනා බව දනිමි
ගීතයක් පමණක්ම වෙමි
මම ඔබේ දෙපාමුල

විහිද යන ගී පියපතින්
පිරිමදිමි මම ඔබ දෙපා
නැගී උස්වී රඳන්නට මට
වරම් නැති කෙදිනවත් දෑඟිලි

මුසපත්ව ගැයුමෙන්
මුසපත්ව යයි මසිත දුබලව
අමතන්න ඔබ සොහොයුරා යැයි
සමිඳුනේ මා සමිඳුනේ...

*රබින්ද්‍රනාත් තාගෝරයන්ගේ ගීතාංජලී කාව්‍යයේ ඉංග්‍රීසි පරිවර්තනයේ පළමු හා දෙවන පද්‍යයන්හි අනුවර්තනයකි.*

**රන්සිරිමල් ප්‍රනාන්දු**

Tripple Gem
Video & Audio Production
Videography and Photography
Keep your memories forever
Weddings
Parties
Functions
Vijitha
Tel - 0412 083 876/ 94495635



SRI LANKAN DENTISTS
Dr. Tusitha Muthuhetti BDSc
Dr. Anne Perera BDSc
KEILOR DENTAL GROUP
PH. 9336 2062
49 MILLEARA ROAD,
KEILOR EAST,
VICTORIA 3033